**ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය - 2020**

-----------------------------------------------------------------

ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය, නාවික හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛ ස්ථානයක් හිමිවන මාර්ග ජාල සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා පවතින ඉල්ලුම සම්පූර්ණ කිරීම සඳහා බස්නාහිර, වයඹ, මධ්‍යම, දකුණ සහ සබරගමුව පළාත්වල ජාතික මාර්ග කි.මී. 202 ක් වැඩිදියුණු කිරීම සහ පාලම් පළල් කිරීම සහ පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු. මිලියන 7,121.32 කට සමාන එ.ජ.ඩො. මිලියන 62.46 ක් වූ අතර ඉන් රු. මිලියන 4,560 කට සමාන එ.ජ.ඩො. මිලියන 40 ක් මූල්‍යනය කිරීමට අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. රු.මිලියන 2,561.32 කට සමාන එ.ජ.ඩො. මිලියන 22.46 ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කල යුතුය. ව්‍යාපෘතියේ කටයුතු 2013 ජනවාරි 16 දින ආරම්භ කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය අවස්ථා දෙකකදී 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්වාගණනය කළ මතය**

------------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පැකේජ 4 ක ඉදිකිරීම් කටයුතු රු. මිලියන 4,255 ක වියදමින් 2015 සහ 2016 වසරවලදී අවසන් කළද, ඒවා 2020 දෙසැම්බර් 31 දිනට නිම කළ වැඩවලට මාරු කර නොතිබුණි. | ජංගම නොවන වත්කම් අවප්‍රමාණය වීම. | නිමකළ ව්‍යාපෘතිවල පවතින කෙරීගෙන යන වැඩ ශේෂය 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනීකරණය කිරීමට සටහන් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලව වත්කම් හඳුනාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සහ මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ ණය මුදලින් රු. මිලියන 111.89 ක මුළු වියදමක් දරා තිබුණි. එහෙත් ඊට අදාළ මුදල රු. මිලියන 80.55 ක් ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවල දක්වා තිබුණි. තවද, රු. මිලියන 31.34 ක වෙනස 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ණය යටතේ සටහන් කරනු වෙනුවට වියදම් කළ හැකි විදේශ ආධාර ලෙස පෙන්වා තිබුණි. | වාර්තා නොමැතිකම නිසා මුදල් අවභාවිතා කිරීමට ඇති හැකියාව. | 2021 වර්ෂයේ සිට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව ගෙවීම් වාර්තා කිරීමට සටහන් කරගතිමි. | ශේෂය සැසඳීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාල ඉඩම් අත්පත් කර ගැනීම මත වූ ප්‍රමාද පොලී සඳහා 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 01 ක ප්‍රතිපාදනයක් සිදුකර තිබුණද, එම ශේෂය තහවුරු කිරීම සඳහා ව්‍යාපෘතිය මගින් සාක්ෂි සපයා නොතිබුණි. | වත්කම් සහ වගකීම් අධිප්‍රමාණය/අවප්‍රමාණය වීම. | COVID තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබුණු මුදල ආසන්න වශයෙන් අප ඇතුළත් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව ප්‍රතිපාදන සිදුකළ යුතුය. |

**2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව මාස දෙකකට වරක්වත් රැස්විය යුතුය. කෙසේ වෙතත්, 2020 වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව රැස්වී නොතිබුණි. | එකඟවෙමි. | සියලුම මෙහෙයුම් කමිටු චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියාත්මක කළ යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් 04 ක් අවසන් කිරීමෙන් පසු, පේරාදෙණිය - බදුල්ල වෙන්කලඩි මාර්ගය- ඒ 005 ප්‍රතිසංස්කරණය කිරීම 2017 ජුනි 09 දින ආරම්භ කරන ලද අතර 2018 අගෝස්තු 26 දින අවසන් කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, එය 2021 ඔක්තොම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණු අතර ව්‍යාපෘති දුර්වල කළමනාකරණය ව්‍යාපෘතියට අමතර පිරිවැයක් දැරීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. | 2021 නොවැම්බර් 30 වන විට කොන්ත්‍රාත්කරු සියයට 92 ප්‍රගතියක් ලබා ඇති අතර තවදුරටත් ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතිය නිම කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| අදාළ කොන්ත්‍රාත්කරුගේ වියදමින් කාර්ය සාධන බැඳුම්කර ලබාගත යුතු බවට වූ කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති කොන්දේසිවලට පටහැනිව, කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන බැඳුම්කර ලබා ගැනීමේ පිරිවැය සඳහන් කිරීමට ඉඩ සලසමින් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතම සකස් කර තිබුණි. ඒ අනුව පේරාදෙණිය - බදුල්ල වෙන්කලඩි පාරේ කොන්ත්‍රාත්කරු විසින් ලබාගත් කාර්ය සාධන බැඳුම්කරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා 119.2(1) ගෙවීම් අයිතමය යටතේ කොන්ත්‍රාත්කරුවන්ට එකවර රු. මිලියනයක මුදලක් අතිරේකව ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් දත්තවල යම් මුදලක් සඳහන් කර නොමැති නම්, මෙම උප වගන්ති අදාළ නොවේ. එබැවින් කාර්ය සාධන බැඳුම්කර සඳහා ගෙවීම් අයිතමයක් ලබා දී ඇත. | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය සිදු කළ යුතු වේ. |

**3.3** **ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලු**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් කැබලි 2829 ක් සඳහා රු. මිලියන 208.67 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණු අතර ඉඩම් කැබලි 168 ක් සඳහා රු. මිලියන 29.57 ක ප්‍රමාද පොලියක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තියට අනුව 2020 දෙසැම්බර් 31 දිනට පවා මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර තිබුණු ඉඩම් කැබලි සංඛ්‍යාව 146 ක් පමණක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | එකඟවෙමි. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |